


ශ්‍රී. බු. ව. 2560 ක්වූ  වප් මස කලාපය, රා. ව. 2016 ක් වූ ඔක්තෝම්බර් මස 15 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# ප්‍රඥාවන්තයා දිළිඳු නොවේ.

(සංයුත්ත නිකාය දළිද්ද සූත්‍රය ඇසුරිනි.)

ධර්මකාමී  පින්වත්නි,

අද වප් පුර පසළොස්වක පොහොය දිනයයි. භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙව්ලොව සිට සංකස්ස පුරයෙන් මිහි මතට වැඩම වීම. පෙරවස් සමාදන් වූ භික්ෂු සංඝයා වහන්සේලා මහා පවාරණය සිදුකිරීම වැනි වැදගත් කරුණු සිහිපත් කර වත් පිළිවෙත්හි යෙදෙන  දිනයකි. අද මෙම දහම් පණිවුඩයෙන් කියාදෙනු ලබන්නේ තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයට අනුව ජීවත් වීමෙන් හිස් ජීවිතයක් නොවී පිරිපුන් පොහොසතෙකු වීමේ මාර්ගයයි.

මේ සඳහා මාතෘකා කරගත්තේ සූත්‍ර පිටකයේ සංයුත්ත නිකායේ සක්ක සංයුත්තයට අයත් දළිද්ද සූත්‍රයයි. භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන දිනක භික්ෂූන්වහන්සේලා අමතා දේශනාකරන ලද සූත්‍රයකි. ඒ රජගහනුවරම වාසය කරපු දුප්පත් මනුෂ්‍යයෙකු පිළිබඳව මේ සූත්‍රය දේශනා කිරීමට පසුබිම සකස් වී ඇත.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතා මහණෙනි පෙර මෙම රජගහනුවර මනුෂ්‍යයින්ගෙ කරුණාවට භාජනය වූ එක්තරා දිළිඳු මනුෂ්‍යයෙක් හිටිය. ඔහු තථාගතයන් වහන්සේ විසින් වදාළ ශාසනයෙහි ශ්‍රද්ධාව සමාදන් වුනා, ශීලය සමාදන්වුනා, ශ්‍රැතය සමාදන් වුනා, ත්‍යාගය සමාදන්වුනා, ප්‍රඥාව සමාදන්වුනා. මේ දිළිඳු මනුෂ්‍යයා එසේ ජිවත්වී මරණින් මතු තව්තිසා දෙව්ලොව උපන්න ඔහු ශරිර වර්ණයෙන්ද දිව්‍යමය සැපයෙන්ද අනිත් දෙවියන් ඉක්මවා බැබලෙනව.

තව්තිසා වාසී අනෙක් දෙවියන් ඉහත කී දේවතාවා මනුෂ්‍යයෙක්ව සිටියදී ඉතා දිළින්දෙක්ය. මනුෂ්‍යයින්ගෙ අනුකම්පාවට කරුණාවට ලක්වූ බැගෑපත්ව සිටි කෙනෙක්ය. එනමුත් මේ තව්තිසා දෙව්ලොවදී අනිත් දෙවියන් ඉක්මවා බැබලෙනවාය. ඉතා පුදුමසහගත ආශ්චර්‍යයීමත් අද්භූත දෙයක්ය. යනුවෙන් දෙව්ලොව වාසී දෙවියන් අතර කථා බහට ලක්වූ බව වදාළහ . මේ කාරණය දුටු ශක්‍ර දේවේන්ද්‍රයා තව්තිසා වාසී දෙවියන් රැස්කොට "පින්වත්නි, ඔබ විසින් මේ දිව්‍යපුත්‍රයාට නින්දා අපහාස නොකළ යුතුයි. මේ දිව්‍ය පුත්‍රයා පෙර මනුෂ්‍යයෙක්ව දිළින්දෙක්ව සිටි බව සැබෑවකි. එනමුත් එයින් නින්දවට ලක්නොවිය යුතුය. උතුම් ගති ඇතිව ඔහු මිනිස් ලොව ජිවත් විය." යනුවෙන් අවවාද කළේය.

ශක්‍ර දෙවියන් විසින් තාවතිංස වාසී දෙවියන්ට මේ දිව්‍ය පුත්‍රයා මිනිස් ලොවදී උතුම් වූ ගතිගුණ උදකරගත් ආකාරය කියල දෙනව. පින්වත්නි මොහු පෙර මිනිස් ලොවදී. තථාගතයන් වහන්සේ වදාළ ශාසනයෙහි ශ්‍රද්ධාවන්තයෙකි. සීලවන්තයෙකි. දහම් ඇසූ පිරූ කෙනෙකි. දීමෙහි යෙදුනාය. ප්‍රඥාවන්තයෙකි. ඒ හේතුවෙන් සුගතිගාමීව එහිද අනිත් අය ඉක්මවා බැබලෙනවාය. මේ යථාර්තය පෙන්වා දුන් ශක්‍ර දෙවියන් තව්තිසා දෙවියන්ට ධර්ම අවවාදයක් සිදු කරනව ගාථා තුනකින් එය බුද්ධාදී උතුමන්ගේ දේසනාවට අනුව පැහැදිළි කලබව භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට වදාළහ.

මෙම දේශනාවෙන් තථාගතයන් වහන්සේ භික්ෂූන්වහන්සේ අමතා හිස් ජිවිත නොවන පිරිපුන් ජිවිතයකට මග පෙන්වා දෙනව. එදත් අදත් මතුවටත් මිනිසුන් ඉක්මනින් අමතක කොට වරද්ද ගන්න තැනක් හැටියට "සැප ලැබෙන්නේ කෙසේද" යන්නට පිළිතුරු ලබාදෙන මේ දේශනාව හොඳින් තේරුම්ගත යුතුයි.

බුදුරජාණන් වහන්සේ නමක් ඉතා දුර්ලභවයි ලොව පහළ වන්නේ. ඒ සසර උපන් සත්වයා එම සසරින් එතෙර කිරීමටය. ඒ සඳහා මඟපෙන්වීම බුදුවරයන් වහන්සේලාගේ වගකීමයි. සසරින් එතෙරවීමට අවශ්‍ය ගුණාංගයන්හි පිහිටුවීම ශාසනයෙහි ලක්ෂණයකි. එවිට යමෙක් සසර කොතෙක් දුරට ගමන්කරයිද ඒතාක් ඔහු නිදුකින් සසර ගමන්කොට පාරමී සපුරා සසර ගමන නවතයි. මෙම සූත්‍රයෙන් භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනව

රජගහ නුවර සිටි ඒ දුප්පත් මනුෂ්‍යයා මරණයෙන් පසු තව්තිසා දෙව්ලොව අනිත් දෙවියන් ඉක්මවා දිව්‍ය සම්පත් ලබා ඒ දුප්පත් මනුෂ්‍යා දෙව්ලොව උපන් ආකාරය.

ඒ මනුෂ්‍යයා ධනයෙන් දිළිඳුයි. අනුන්ගෙ කරුණාවට අනුකම්පාවට භාජන වූ අසරණයෙක් ඔහු එයින් දුප්පත් වුවද තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ශාසනයෙහි ශ්‍රද්ධාව සමාදන් වී තිබෙනව. ඒ පළමු පියවරයි. මෙහි විශේෂ වචනයක් තියනව. "සො තථාගතපපවෙදිතෙ ධමම විනයෙ සදධං සමාදියිත්වා" ඔහු තථාගතයන් වහන්සේ වදාළ ධර්මයෙහි සහ විනයෙහි ශ්‍රද්ධාව සමාදන්විය. එයින් කියන්නේ තථාගතයන් වහන්සේ සහ උන්වහන්සේගේ ධර්මය සහ විනය සසර දුක් නැති කිරීමටත් සසර ගමන නවතා සහමුලින් දුකෙන් මිදීමටත් ඒකාන්තයෙන් හේතුවන බව විශ්වාසයෙන් පිළිගැනීමයි. එය තථාගත ධර්මවිනයෙහි ශ්‍රද්ධාව සමාදන් වීමයි.

ශ්‍රද්ධා යනු හොඳ හැටි තැබීමයි. කුමක් හොඳ හැටි තැබීමද ? සිත හොඳ හැටි තැබීමයි. කොහේ හොඳ හැටි තැබීමද ? බුදුරජාණන් වහන්සේ, සද්ධර්මය, ආර්‍ය්‍ය සංඝරත්නය, ත්‍රිවිධ ශික්ෂාව, පෙර ජාතිය, මතු ජාතිය, පෙරමතු දෙජාතිය, හේතුඵල දහම යන කාරණා අට කෙරෙහි හොඳ හැටි සිත පිහිටුවා තැබීමයි. හොඳ හැටි තැබීමට ඉහතකී අට කවරේදැයි දැනගත යුතුයි. ඒ පිළිබඳ සැක නොතිබිය යුතුයි. වරදවා නොසිතිය යුතුයි. එවිට තම සිත ඉහතකී අටසථානයෙහිම හොඳ හැටි තැබිය හැකිය. එසේ තැබීම ශ්‍රද්ධාවයි. සරළව කියන්නේ නම් තුනුරුවන් පිළිබඳ අවංක විශ්වාසයයි. සසර දුක් නැතිකොට නිවීමට තවකෙනෙකුට සමාන කළ නොහැකි අනුශාසකයන් ලෙසට බුද්ධ රත්නයද, ධර්මරත්නය සසර දුකින් මිදීමේ උපදේශය ලෙසද, ඒ අනුශාසනය අනුව ධර්මය නැමති බෙහෙත පානය කිරීමෙන් සියළු කෙළෙසුන් නසා සුවපත් වූ උතුමන් (ආර්‍ය්‍ය සංඝරත්නය) ආදර්ශ දයකයන් ලෙසටද, නොකෙළෙසුනු සිතින් විශ්වාස කිරීමයි.

ශ්‍රද්ධාව පිළිබඳව තව සවල්පයක් මෙහි දැක්විය යුතුය. ශ්‍රද්ධාව වස්තුවක් ලෙසට දහමෙහි දැක්වේ. වස්තු නානාවිධ වෙති. එයින් ශ්‍රද්ධා වස්තුව ලොව ඇති හැම වස්තූන්ට වඩා උසස්වේ. මොන වස්තුවකින් වුවද ලැබෙන ඵලය එක සමානවේ. "හිරඤ්ඤ සුවනනාදි විතතං උපභොගපරිභොග සුඛං ආවහති, ඛුපපිපාසාදි දුකඛංපටිබාහති, දළිදදියං වූපසමෙති, මුතතාදි රතන පටිලාභ හෙතු හොති, ලොක සන්තුතිංච ආවහති" එහි අදහස රන් රිදී ආදී වස්තුව සහ සැප ගෙනදේ, සා පිපාසාදී දුක් නැති කරයි, දිළිඳුකම සංසිඳුවයි, මුතු මැණික් ආදී රත්න ලැබීමට හේතුවෙයි, ලෝකයාගේ ගරු බුහුමන් ද ලැබෙයි. මේ දැක්වූයේ වසතුවකින් ලැබෙන ඵලයයි. ශ්‍රද්ධාවෙහි සමාදන් වූ තැනැත්තාටද ඉහත කී ඵලයෝ සියල්ලක්ම නොඅඩුව ලැබේ. තවද ශ්‍රද්ධාව ඉහත කී ලෞකික සුවයද ලෝකෝත්තර සුවයද ගෙන දේ. "සදධා ධූරෙන පටිපනනානං ජාති ජරාදි දුකඛං පටිබාහති" ශ්‍රද්ධා වන්තයා ජාති ජරාදී දුක් නැති කරයි. "ගුණ දළිදදියං

වූපසමෙති" ගුණයෙන් දිළිඳු නම් ඒ දිළිඳුකම නැතිකර ගුණවත්කම ඇතිකරයි. එපමණක් නොව ධර්මාවබෝධයෙන් සසරින් එතෙර වීමට බෝධි ගුණාංගයෝද ඇති කරයි. මෙයින් ද ප්‍රකට වෙනව සූත්‍රයේ සඳහන් දිළිඳු මිනිසා අනිත් දෙවියන් අභිබවා බැබලීමට හේතුව.

මීලඟ පියවර ශීලය සමාදන්වීමයි. "සීලං සමාදියිත්වා" එය ඊළඟ සාධකයයි. ශ්‍රද්ධාවන්තයෙකුට ඊලඟට පිහිටන ගුණයයි. සංවරය යනු සීලයයි. එනම් හික්මීමයි. ශ්‍රද්ධාවන්තයා යනු ඔහුගේ සිත බුද්ධ ආදී ඉහත කී අටතැන්හි නිසි පරිදි පිහිටුවීම නම් තෙරුවන් සරණ යෑමයි. සරණාගමනයයි. තෙරුවන් සරණ සමාදන් වූ පුද්ගලයා ශීලය සමාදන්වෙයි. සමාදන් වීම යනු පිළිගැනීමයි. කෙසේ පිළිගැනීමද සසර දුකින් එතෙර වීමටත් එතෙක් සැප හෙවත් සුගතිගාමී වීමටත් විශ්වාසයෙන් පිළිගැනීමයි. පිහිටීමයි. එසේ වූ පුද්ගලයා සසර දුකින් එතෙර නොවුවහොත් දෙවියන් අතර උපදින බව දීඝ නිකායේ මහාසමය සූත්‍රයේදී මෙසේ වදාළහ.

යෙ කෙචි බුදධං සරණං ගතාසෙ - නතෙ ගමිසසනති අපායං

පහාය මානුසං දෙහං - දෙව කායං පරිපූරෙසසනති

"යමෙක් බුදුන් සරණ ගියේද, ඔවුහු අපායට නොයන්නාහුය.

මරණින් මතු දෙව්ලෝ ඉපදී දෙව්සැප ලබන්නාහුය."

මෙසේ වදරා ඇත්තේ කෙනෙක් "බුඬං සරණං ගචඡාමි" යි කී පමණින් අපායෙන් මිදී දිව්‍යලෝකෙ උපදින නිසා නොව පිහිටකොට පිළිගැනීම හෙවත් තථාගත ශාසනයට අනුව පිළිපැදීමෙන්, සැප ලබන බව දැක්වීමටය. වාක්‍ය කී පමණින් අපායෙන් මිදෙන්නේ නම් දිව්‍ය සැප ලබන්නේ වචන උච්චාරණය කිරීමේ හැකියාව ඇති පුද්ගලයන්ය. එසේ නම් දෙව්ලෝ ඉඩ මදිවී අපාය පාළුවෙයි. වර්තමානයේ බොහෝ බෞද්ධයින් හිතා ඉන්නේ වාක්‍ය කී පමණින් තෙරුවන් සරණ යෑම ප්‍රමාණවත්ය කියාය. ඒ නොදන්නා කමයි. දන්නා පුද්ගලයා පංචශීලය ආදී උසස් ශීලයන් සමාදන්වී ආපායාදී දුකින් මිදී දිව්‍ය සම්පත් ලබයි. සසරින් එතෙර වූ පරම සුවයද උදාකරගනී. මෙම දළිද්ද සූත්‍රයේ පමණක් නොව ඒ බව අංගුත්තර නිකායේ පංචක නිපාතයේ මෙසේ දැක්වේ. යමෙක් "සතුන් නොමරයි, බොරු නොකියයි, කාමයෙහි වරදවා නොහැසිරෙයි, හොරකම් නොකරයි, රහමෙර පානය නොකරයි, ඔහු මේ අකුසල් පහෙන් වෙන්ව සිටියේ නම් සිල් ඇත්තෙකැයි කියනු ලැබේ. ඒ කල්‍යාණවන්තයා මරණින්මතු දෙව්ලොව උපදී." සීලය සමාදන්වනවා යයි කියනුයේ වාක්‍ය ප්‍රකාශ කිරීම නොව දුකට හේතු නොවන ජීවන පසුබිම බව තේරුම් ගත යුතුය. ඒ ජීවිතය පිරුනු ජීවිතයකි. හිස්නොවේ.

මීළඟ කාරණය වන්නේ "සුතං සමාදියිත්වා" ශ්‍රැතය සමාදන් වීමයි. ශ්‍රැතය යනු අසා දැන උගත් දෙයයි. ඒ අතර ශ්‍රී සදධර්මය සමාදන්වෙනවා යනු සසරින් එතෙර වීමටත් එතෙක් දුක් සමනයකර අපායාදී දුක් වලට නොවැටී දරා සිටිනුයේ ධර්මය නිසා වෙනත් පිහිටක් නොමැති නිසා හොඳින් ධර්මය දැන උගත් කමයි. ධර්මය අසා දැනගතයුතු ආකාරය අංගුත්තර නිකායේ ඡකක නිපාතයේ "සුසසූසති සූත්‍රයේ" මෙසේ දැක්වෙයි. " මහණෙනි සද්ධර්මය ඇසුව නමුත් කුසල ධර්මයන්හි යහපත් බව දැන ධර්මයෙහි නොපිහිටීමට හේතු හයකි. ධර්මය ඇසීමට අකමැත්ත, කන්යොමු නොකිරීම, දැනගැනීමට හිතයොමු නොකිරීම, අනර්ථය ගැනීම, අර්ථය බැහැර කිරීම, තථාගත ශාසනයට අනුව නොසිතීම හෙවත් ඉවසීම නැතිකමයි." මෙහි යහපත් පැත්ත ක්‍රියාත්මක කිරීම යනු ශාසනයට අනුලෝමව සිතා ධර්මයට බැස ගැනීමයි. ඒ ඉහත කී කරුණු හයට අනුව ධර්මය අසා දැනගැනීමයි. ඔහුට ධර්මයෙහි සුධර්ම බව වැටහේ. ශ්‍රැතය සමාදන්වනවා යනු ධර්මය නිසි පරිදි අසා දැනගැනීමයි. එම කාරණයෙන්ද ජීවිතය පිරේ. හිස්නොවේ.

හිස්නොවී පිරිපුන් ජීවිතයක් ලැබීමට හේතු වන මීළඟ හතරවෙනි කාරණය වන්නේ "චාගං සමාදියිත්වා". ත්‍යාගය හෙවත් දීමෙහි පිහිටීමයි. එය අත් හැරීම යනුවෙන් ද ව්‍යවහාරවෙයි. නුවන පෙරදැරිව තමන් සතු ආහාර වස්ත්‍ර පරිත්‍යාග කිරීමට යම් සිතක් උපකාරීවේද එය දන නම් එය මනුෂ්‍යයෙකුගෙන් මිස තිරිසන් සතෙකුගෙන් සිදුනොවේ. ඔවුන් දෙන්නේ පැටවුන් හට කිරි හෝ ආහාර පමණි. එය දනයක් නොවේ. භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවීමටත් පෙර මිනිසුන් තමතමන්ගේ හැටියට පරිත්‍යාග කළහ. බුදුරජුන් ලොව පහළවීමෙන් පසු එම ධර්මයට අනුව සසර කතරින් එතෙර වීමට සහ එතෙක් දුගති දුකින් මිදී සුගති සැප සඳහා පුණ්‍ය ක්‍රියාවක් ලෙසට උතුම්කොට සැළකූහ. ඒ දීම කවරේදැයි බුදුරජාණන් වහන්සේ පහද දුන් නිසාය. "දනං බලූ සභාවේන සගගමානුස හොග දං" දනය සවභාවයෙන්ම දෙව්මිනිස් සැප දෙන්නේය යනුවෙන් වදලේ සිත ප්‍රධාන වන නිසාමය. තවද චතුරාර්‍ය්‍ය සත්‍ය මුලින්ම පැහැදිළි කළ ධමමචකකපවතතන සූත්‍රයේදී විශේෂයෙන් "චාගො පටිනිසසගෙගාමුතති අනාලයො" තණ්හාවේ නොඇලී නැසීමක් වේද "චාගො" යනු අත්හැරීමයි කිනම් අත්හැරීමක්ද භව තණහාව නැමති බලවත් අල්ලාගැනීම අත්හැරීමයි. හාත්පසින්ම අත්හැරීමයි. එවිට පරිත්‍යාගයයි "චාගං සමාදියිත්වා" යනු එම අත්හැරීමට එකඟසිතක් ඇතිකර ගැනීමයි. පරිත්‍යාග කරන්නා සැපලබයි.

මීලඟට පස්වෙනි කාරණය වන්නේ "පඤඤං සමාදියිත්වා" ශාසනය යනු සීල, සමාධි, ප්‍රඥා යන ශිකෂා තුනය එහි කෙළවරද ප්‍රඥාවයි. සසර සියළු දුක් කෙළවර කොට නිවන්සැප සාදගැනීමටද ප්‍රඥාව වුවමනාය. ප්‍රඥාව වැඩෙන කරුණු අටකි. 1 වයස පිරීමෙන් 2 යසස් පිරිවර ලැබීමෙන් 3 විචාරීමෙන් 4 ගුරු ඇසුරින් 5 නුවන මෙහෙයා සිතීමෙන් 6 ධර්ම සාකච්ඡා කිරීමෙන් 7 තමන්ට හිතවත් අය ආශ්‍රය කිරීමෙන් 8

තෙරුවන් පවතින සුදුසු ප්‍රදේශවල වාසය කිරීමෙනි ප්‍රඥාවන්තයාගේ ලක්‍ෂණ ප්‍රධාන වශයෙන් තුනකි. 1 ගැඹුරු ප්‍රශ්ණ සිතා තීරණය කෙරේද 2 අතිශය අහිතකර ප්‍රාණ වධ ආදී වැදිකම් නොකෙරේද 3 අවස්ථාව පැමිණි කළ දනාදී කුසල් අඩු නැතිව කරයිද එබඳු පුද්ගලයා කදණවන්ත යෙකැයි බුද්ධාදී උතුමන් කියති. ඔහුගේ ජීවිතය හිස් නොවේ. පිරිපුන් ජීවිතයකි.

මෙම සූත්‍රයට අනුව ඒ දිළිඳු මනුෂ්‍යයා ඉහතකී අංග පහෙන් යුතුව ජීවත්වී මරණින් මතු දිව්‍ය සැපයෙහි ඉහලින්ම බැබලීම නිසා තව්තිසා වැසි දෙවියන් එම දිව්‍යපුත්‍රයා හට නින්දා කරද්දී සක්දෙවිඳු විසින් ඔහු මිනිස්ව සිටියදී ශ්‍රද්ධාදී ගුණ පිහිටුවා ගැනීම නිසා ඒ සැප ලැබුන විදි සහ දෙවියන් අතර බැබලීමක් ඇතිවූ ආකාරය කියාදී දෙවියන්ටත් වරදින නිසා වැරදි ආකල්ප ඉවත් කොට ගාථාතුනකින් ශ්‍රද්ධාදී ගුණාංගයන්ගේ අගය වර්ණනා කළබවද භාග්‍යවතුන් වහන්සේ පැහැදිළි කළහ. එම ගාථා තුනෙහි සරළ අර්ථය මෙසේය.

ඞ "යමෙකුට බුදුරජාණන් වහන්සේ පිළිබඳව ශ්‍රද්ධාව ස්ථිරවද ශීලය යහපත්වද පිහිටියාද ආර්‍යයන්වහන්සේලාට අයත් වු සීලයෙන් යුතු නිසා ප්‍රශංසා ලබයිද"

ඞ යමෙකුට ආර්‍ය සංඝරත්නය කෙරෙහි පැහැදීමද සෘජුවූ සදණ දර්ශණයක්වේද, ඔහු දිළින්දෙකු නොවේ යයිද හිස් ජීවිතයක් නොවේ යයි බුද්ධාදී උතුමෝ කියති

ඞ ඒ නිසා ප්‍රඥාවන්තයා බුදුරජාණන් වහන්සේගේ ධර්මවිනය සිහි කරමින් ශ්‍රද්ධාව, සීලය, පැහැදීම, ධර්මය නුවනින් දැකීමද ඒ අනුවද පිළිපදිමින් පිරිසිදු බවට පත්වන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

වත්මන් ලෝකයේ මිනිසුන් මේ අවවාදයෙහි නොපිහිටීමෙන් ශාසනය පිළිබඳව නොදන්නා කම නිසා කෙතරම් ධර්මයෙන් විනයෙන් ඈත්වී දුකට පත්වේදැයි තේරුම් ගත හැකිය. රජගහනුවර විසූ ඒ දුප්පත් මනුෂ්‍යයා වත්මන්ලොව සැප සොයා අපරාධකරන මිනිසුන්ට හොඳ ආදර්ශයකි. තෙරුවන් සරණ ගත අපද දෙවියන් ගරු කරන උතුම් මිනිස්ගුණ වර්ධනය කර දිළිඳුකමින් බැහැරවූ සුගති සම්පත් විඳ උතුම් නිවනින් සැනසෙමු.